GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

05-09-2012

**මාධ්‍ය නිවේදනය**

**වෛද්‍ය පරිපාලන නිලධාරීන්ගේ මාරු වීම් ක්‍රියාත්මක නොවීම සම්බන්ධවයි**

2012 වසර සඳහා වු වෛද්‍ය පරිපාලන ස්ථාන මාරු ලැයිස්තුව සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් ප්‍රකාශයට පත් කොට මාස කිහිපයක් ගතව ඇතත් අදාල ස්ථාන මාරු ක්‍රියාත්මක වීම අකර්මන්‍ය වී ඇති බවත් පෙනෙන්නට ඇත.

මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක වෛද්‍ය ශාන්ති සමරසිංහ මහත්මිය විසින් ගෙන ඇති අධිකරණ ක්‍රියාදාමයක් මීට හේතු වී ඇති බව පෙනෙන්නට ඇති අතර එම නිසා සියලුම ස්ථාන මාරු අක්‍රමවත් වී ඇත.

මීට පෙර අවස්ථාවලදී මේ ආකාරයට අධිකරණමය ක්‍රියාදාම පැන නැගී ඇතත් සෞඛ්‍ය අමාත්‍යාංශය ඉතාමත් ඉක්මනින් එය නිරාකරණය කර අදාල ස්ථාන මාරු යථාවත් කිරීමට කටයුතු කොට ඇත. නමුත් මේ අවස්ථාවේදී ඒ ආකාරයට කටයුතු කරන බවක් පෙනෙන්නට නැති අතර ඉතාමත් නිද්‍රාශීලි පිළිවෙතක් අනුගමනය කරමින් සිටියි.

මේ ආකාරයේ කරුණු පෙල ගැස්වීම නිසා ඌව, සබරගමුව සහ උතුරු මැද ඇතුලු පළාත් කිහිපයක පළාත් පරිපාලන තනතුරු පුරප්පාඩු සිදු වී ඇති අතර පළාත තුල ජනතාවට සෞඛ්‍ය සේවයේ උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමට නොහැකි තත්ත්වයක් උද්ගත වී ඇත.

මෙ ලෙස එක් පුද්ගලයෙකුගේ ක්‍රියාකලාපය නිසා මුළු සෞඛ්‍ය ක්ෂේත්‍රයම බිඳ වැටීමට සලස්වා බලා සිටිම සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඉහළ නිලධාරීන්ට තරම් නොවන බව අප සංගමයේ හැඟීමයි. මේ ලෙස රෝගී ජනතාව විවිධ දුෂ්කරතා වලට මුහුණ දීමත්, සෞඛ්‍ය සේවාව පවත්වා ගෙන යාමට නොහැකි වීමත් නිසා රටේ සෞඛ්‍ය දර්ශක ඉහළ මට්ටමක පවත්වා ගැනීමට නොහැකි වනු ඇත.

පසු ගිය 26 වන ඉරිදා පැවති අප සංගමයේ මධ්‍යම කාරක සභාවේදී රට පුරා විසිරි සිටි අපගේ නියෝජිතයන්ගේ මෙම කරුණ දැඩි සාකච්ජාවට බඳුන් විය.

1. අදාල අධිකරණ කටයුතු සඳහා රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය උපරිම මැදිහත් වීමක් සිදු කිරීමටත්

2. මෙම අධිකරණ කටයුත්ත සඳහා සක්‍රියව මැදිහත් වන ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශයට බල කිරීමටත්

3. එසේ නොවන්නේ නම් ඉදිරි සති 2ක ඇතුලත ඉතා දැඩි වෘත්තිය සමිති ක්‍රියාමාර්ගයක් ගැනීමටත් සියලු දෙනාම ඒකමතිකව තිරණ කරණ ලදි.

ඒ අනුව අප සෞඛ්‍ය අමාත්‍යාංශයට දැඩි ලෙස අවධාරණය කර සිටිනුයේ අදාල මාරුවීම් ලැයිස්තු ක්‍රියාත්මක කිරීමට සක්‍රියව මැදිහත් වී, ගැටළු නිරාකරණය කර ගන්නා ලෙසත් එසේ නොවීමෙන් වෘත්තිය සමිති ක්‍රියාමාර්ගයකට අවතිර්ණ වීමේ අවධානම නොවැලැක්විය හැකි බවත්ය.

ස්තුතියි

වෛද්‍ය චන්දික එපිටකඩුව
ලේකම්

වැඩිදුර විස්තර - වෛද්‍ය නලින් ආරියරත්න - 0714800942
වෛද්‍ය නවීන් ද සොයිසා - 0718582444
වෛද්‍ය නලින්ද හේරත් - 0717876516